නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 94 - 102

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# යකඩ සිල්පර නවකතාව පිළිබඳ විචාරයක්

භාෂාවක් උපයෝගී කර ගනිමින් රස ජනිත කරවන කලාව සාහිත්‍යය ලෙස සරල ව අරුත් ගැන්විය හැකි ය. ගද්‍ය සාහිත්‍යය සහ පද්‍ය සාහිත්‍යය ඊට අයත් සාහිත්‍යාංගයෝ වෙති. සාහිත්‍ය කලාවේ මූලික පරමාර්ථය බුද්ධිගෝචර රස වින්දනය ම වන අතර, සාහිත්‍යය වනාහි නිර්මාණය, රසවින්දනය හා විචාරය යන ක්ෂේත්‍ර තුනකින් සමන්විත බව විචාරක මතය යි. ඒ වූ කලී සාහිත්‍ය නිර්මාණය හුදෙකලාව තිබිය යුත්තක් නොවන අතර ම එය කියවිය යුතු ය, රස විඳිය යුතු ය මෙන් ම විචාරය කළ යුතු බව යි. මහා පඬි විශ්වනාථට අනුව විචාරය යනු “විචාරයට භාජනය වන නිර්මාණයේ අඩංගු තත්ත්වය නිර්මාණය කිරීම යි.” ටී.එස්. එලියට් සඳහන් කළ පරිදි විචාරයේ හා විචාරකයාගේ කාර්යය විය යුත්තේ කලා කෘතීන් පැහැදිලි කිරීම හා රුචිකත්ව නිවැරදි මඟ යැවීම යි. නවකතාව වූ කලී සහෘද චිත්ත සන්තානයේ රස නිෂ්පත්තියට මූලික වන මානව ජීවිතය විවරණය කරනු ලබන ගද්‍යමය ආඛ්‍යානයක් ලෙසින් සරල ව අර්ථ දැක්විය හැකි ය. ඊ.එම්. ෆෝස්ටර්ගේ ප්‍රචලිත එහෙත් තරමක් පැරණි නිර්වචනයකට අනුව නවකතාව වනාහී කතාන්දරයක් කියන්නකි. එමෙන් ම කතාවක්, චරිත, කතා වින්‍යාසයක්, මනස්සෘෂ්ටියක්, මනා දැනුමක්, ආකෘතියක් හා රිද්මයක් නොමැති ව නවකතාවක් තිබිය නොහැකි ය. (පල්ලියගුරු, 2005, පි. 29). නවකතාව යනු සත්‍ය හා කල්පිතය අතර මනා සංකලනයක් මෙන් ම මානව දිවි සැරියේ විවිධ පැතිකඩ නිරූපිත පෘථුල මාධ්‍යයකි.

සිංහල නවකතාව පිළිබඳ විචාරාක්ෂිය යොමු කිරීමේ දී සිංහල නවකතාව කලාත්මක මඟකට පිවිසුණේ වර්ෂ 1944 දී නිකුත් වුණු මාර්ටින් වික්‍රමසිංහයන්ගේ **ගම්පෙරළිය** කෘතියෙන් බැව් අවිවාදයෙන් පිළිගැනෙන කරුණකි. සිංහල නවකතාවේ විෂය පුළුල් කිරීමත් එය සියුම් කලාත්මක නිර්මාණයක් වශයෙන් අගය කිරීමට සැලැස්වීමත් උක්ත නවකතාවෙන් සිදු වූ අනභිභවනීය මෙහෙවරකි. ඉකුත් දශක පහක වැනි කාලය තුළ සිංහල නවකතාව විවිධ දිශානති ඔස්සේ ගමන් කිරීමේ දී සංඛ්‍යාත්මක වශයෙන් නවකතා අති මහත් ප්‍රමාණයක් සිංහල සාහිත්‍යයට දායාද වී ඇත. ඒ අතුරෙන් 2018 වර්ෂයේ දී රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලද හොඳ ම නවකතාව සහ එම වර්ෂයේ දී ම ස්වර්ණ පුස්තක සම්මාන අවසන් වටය සඳහා නිර්දේශිත ප්‍රශස්ත නවකතාවක් ලෙස කතුවර විමල් උදය හපුගොඩආරච්චිගේ **යකඩ සිල්පර** නවකතාව දැක්විය හැකි ය. ප්‍රස්තුත නවකතාව නූතනයේ ජනප්‍රිය වෙමින් පවතින ආඛ්‍යාන වෙසෙසක් වන අතීත ආසියාතික සමාජය සොයා යමින් සාහිත්‍යකරණයේ යෙදීමේ ප්‍රවණතාව හෙවත් ඓතිහාසික නවකතා ශානරයේ නවකතාවකි. තව ද සිංහල සාහිත්‍යාවලියට නව ලේඛකයකුගේ සම්ප්‍රාප්තිය සටහන් කරන්නක් ලෙස ද අවධාරණයට බඳුන් කළ හැකි ය.

නවකතාවේ වස්තු විෂය වෙත විචාරාක්ෂිය යොමු කිරීමේ දී “කතා වස්තුව” නවකතාවේ මූලික අංගයක් වශයෙන් සැලකිය හැකි ය. කතා වස්තුවක් නොමැති ව නවකතාවක් ගෙතිය නොහැකි ය. නවකතාවේ ඇටසැකිල්ල වශයෙන් සැලකිය හැකි කතා වස්තුව ඉතා ම පැරණි වූත් සරල වූත්

9 772950 655005

සාහිත්‍යාංගයකි.'' (ඒකනායක, 2012, පි. 213). ගැඹුරු සාහිත්‍ය කෘතියක වස්තු විෂය මතුපිට සහ යටි පෙළ ලෙස අරුත් ද්වයකින් සමන්විත ය. මතුපිට අරුත යනු හුදී ඕනෑ ම පාඨකයකුට කියවා රස විඳිය හැකි අර්ථයකි. එහෙත් යටි පෙළ අරුත යනු විචාරාක්ෂියෙන් යුතු පාඨකයාගේ නුවණැස විසින් ග්‍රහණය කර ගනු ලබන්නකි. **යකඩ සිල්පර** නවකතාවේ වස්තු විෂය කෙරෙහි විචාරාක්ෂිය යොමු කිරීමේ දී නවකතාවේ මූලාරම්භය විසි වන සියවසේ මුල් භාගය වන අතර විෂය පථය ඉතා පුළුල් ය. විවිධ සිද්ධීන්ගෙන් ගහණ ය. සියලු චරිත සහ සිද්ධීන් මනාව පෙළගැස්වීම කෙරෙහි කතුවරයාගේ අවධානය යොමු වී ඇත. ආසියාතික සමාජයේ රදලයන්, කුලයෙන් පහතට හෙළා සලකන ගැමියන් හෙවත් කුල හීනයන්, බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය හා ඒ පාලනයට සහාය වන දේශීය රදල පැලැන්තිය යනාදි වශයෙන් සමාජ ධුරාවලිය නියෝජනය කරන විවිධ චරිත සහ සිද්ධි නවකතාවේ මතුපිට පෙළෙහි දී පාඨකයාට හමුවේ. තත්කාලයේ ගනේවත්ත දක්වා ඉදි කරන ලද දුම්රිය මාර්ගය යාපනය දක්වා ඉදිරියට ගෙන යාමේ දී වන්නියේ ජනතාවගේ දිවිසැරියට බ්‍රිතාන්‍ය යටත් විජිත බලහත්කාරයේ ස්වරූපයෙන් ධනවාදයේ කඩා වැදීම සහ එමගින් ඔවුන්ගේ ජීවිතවල සිදු වන විපර්යාස නවකතාවේ යටිපෙළ අරුත් ගන්වයි. උක්ත සඳහන් කළ පරිදි ම පුළුල් විෂය පරාසයක් බැවින් **යකඩ සිල්පර** නවකතාවේ තේමාව පැති කිහිපයක් ඔස්සේ සාකච්ඡාවට බඳුන් කළ හැකි ය. නවකතාව යනු අධ්‍යයනයක හා පර්යේෂණයක ප්‍රතිඵලයක් යැයි කියනු ලබයි. ඒ අනුව විමල් උදය හපුගොඩආරච්චි සිය අනුභූතිය ගොඩ නඟා ගැනීමේ දී විෂය ක්ෂේත්‍ර කිහිපයක් ගැඹුරින් අධ්‍යයනය කර ඇති බැව් විද්‍යාමාන වේ. ඒ වූ කලී දුම්රිය මාර්ග ඉදිකිරීමේ ඉතිහාසය, ලංකාවේ කුල ක්‍රමය, මානව සම්බන්ධතා සහ තත්කාලීන සමාජ ආර්ථිකය පිළිබඳ ය.

වන්නිය මැදින් උතුරු දුම්රිය මාර්ගය ඉදි කිරීම සරල කාර්යයක් නොවී ය. ඊටත් වඩා සියවස් ගණනාවක් ස්ථාපිත වූ මිනිස් පැවැත්මකට එරෙහි ව නව ධනවාදී සබඳතා බිහිකරමින් පැරණි ලාංකේය ජන ජීවිතය උඩු යටිකුරු කරමින් ගමන් කරන්නක් වූ හෙයින් ම  දුම්රිය මාර්ගය ඉදි කිරීම යම් ආකාරයක විප්ලවකාරී ස්වභාවයකින් හෙබි වූ බැව් කතුවරයා විසින් ගෙනහැර දක්වනු ලබයි. ධූම රථ මාර්ගය ඉදි කිරීම සමග යටත් විජිත ඒකාධිකාරයට නතු ව ශ්‍රම විභජනය සිදු වන බැවින් සිංහල රදල පැලැන්තිය යැයි කියාගන්නා මානව කොටස සතු බලපරාක්‍රමය ක්‍රමික ව හීන වෙයි. එබැවින් සිය බල පරාක්‍රමය ආරක්ෂා කරගනු වස් එකී කාර්යයට ඔවුහු තද බල විරෝධතාවක් දක්වන බව කථකයා අවස්ථාවෝචිත ව ගෙනහැර දක්වයි. එහෙත් යටත් විජිතකරණයේ ම අතකොළු බවට පත් ව සිටි එකී රදල පැලැන්තියට තම විරෝධතාව ඍජු ව ප්‍රකාශ කිරීමේ අවකාශයක් නොවූ බැවින් ඒ සඳහා ඔවුහු හුදී ගැමි ජන විශ්වාසවල පිහිට පැතූහ. අප්‍රිකාවේ යටත් විජිතයන්හි ජීවත් වූ ගෝත්‍රික ජනයා සුදු ජාතිකයින් ගමන් කළ බයිසිකලය ''යකඩ අශ්වයා'' ලෙස හැඳින්වූ අතර බයිසිකල් ගස්වලට තබා බැඳ අනතුරු ව ඒවාට මුගුරුවලින් පහර දෙමින් ඔවුන්ගේ පරිහානිය පැතූහ. ශ්‍රී ලංකාවේ ද දුම්රිය මාර්ගය ඉදි කිරීමට එරෙහි වූ ප්‍රභූ පන්තිය එය විනාශකර දමන ලෙස දෙවියන්ට කන්නලව් කළ බවත් ඉන් නොනැවතී රේල්පීලි සොරකම් කරවීමෙන් ද මෙකී ක්‍රියාදාමය කඩාකප්පල් කරවීමට ගත් ප්‍රයත්නයක් කතුවරයා පරිකල්පනයෙන් යුතු ව දක්වයි.

9 772950 655005

"ලොකු නායක ආරච්චිලත්, කරඹේ ගුණ බණ්ඩා ආරච්චිලත් ධූමරථ පාර තැනීම නතර කරවන්නට දිය බැටේ දේවාලයට ගොස් පළි ගැසීමට කතිකා කර ගත්තෝය." (හපුගොඩආරච්චි, 2018, 129).

ශ්‍රී ලංකාවේ පුරාණ කුල ක්‍රමය නැතහොත් සමාජ ස්ථරායනය තහවුරු වී තිබුණේ ඉඩම් හා ගොවිතැන පදනම් ව ය. එකී ක්‍රියාදාමයන්හි පැවති කුල පීඩනය මෙකී කෘතියෙන් මනා ව විවරණය වේ. කුලහීන කාන්තාවන් ලිංගික මෙවලම් ලෙස කුලීනයන් භාවිත කිරීම තත්කාලීන සමාජ සම්මතයක් බව ද ගම්‍ය වේ. විශේෂයෙන් ම ඉහළ කුලවල වංශවතුන් ඉතා නාඹර දැරිවියන් ඉඳුල් කිරීම ඉතා පැරණි සිරිතකි. **බවදූක** හා **බවකර්ම** චිත්‍රපටවලින් කියාපාන්නේ ද මෙකී සංසිද්ධීන් ම ය.

"හැම දොහොකම කෙල්ලක් දීගතල ගෙනා දින දැකුම් ඉඳුල් කරන්නා වායේ ආරච්චිල කෙල්ල ඉඳුල් කිරීමට යයි. ඊට පස්සෙන් පහු විදානෙලා වගේ නිලමක්කාරයෝ ද එති. උන්ට ද අඩුක්කු පුදන්නා වාගේ කෙල්ල දිය යුතුය. හීනයන් වෙලා උපදින එක කරුමයකි." (හපුගොඩආරච්චි, 2018, 115).

උක්ත ප්‍රකාශයෙන් රදල පැලැන්තියේ බල කාමුකත්වය සහ අමානුෂිකත්වය මෙන් ම කුලහීනයන් ලෙස සලකන හේනයන්ගේ චිත්ත සන්තානයේ බුර බුරා නැගෙන ශෝකය, පශ්චාත්තාපය විවරණය කිරීමට කතුවරයා සමත් වේ. සමාජ ස්තරායණය මතින් ගොඩ නැඟුණු පරපීඩකත්වයෙන් දිගු කාලීන ව බැට කෑ හේන්යන්ගේ දීන බව සියල්ල ම කරුමයට භාර දී කරබාගෙන සිටීම මඟින් විවරණය වේ. ගොරබාගේ සිට රම්බා දක්වා නියෝජනය වන කුලයෙන් පහත් ලෙස සලකනු ලැබූ සාමාන්‍ය ජනතාවට දුම්රිය මාර්ග කර්මාන්තය විමුක්තිකාමී ප්‍රවේශයක් ලබා දෙයි. රදලයන් යටතේ බැල මෙහෙවර කිරීමට සහ ඔවුන්ගේ අතපල්ලෙන් වැටුණු උන් ලෙස වාසය කරනවාට වඩා වැටුප් ශ්‍රමික ජීවිතය ඔවුහු උද්‍යෝගයෙන් වැලඳගනිති. එහෙත් කුලහීනයන් නොදැනුවත් ව වුව ද භාර ගන්නා ජීවිතය යනු හුදෙක් ම අධිරාජ්‍යවාදියෙකුගේ පාලනයෙන් ඔබ්බෙහි වූ කෲර මර්දනකාරීත්වයකට මුහුණ දීම බව වටහා ගන්නේ බොහෝ කල් යාමේ දී ය. ඩන්ස්ටන් මුලර් නමැති දුම්රිය මාර්ග ඉදිකිරීම් ක්‍රියාදාමයේ පාලකයා සහ ඔහුගේ අතවැසි සොයිසාගේ නියෝග අනුව දුම්රිය මාර්ගයේ වැඩ ආරම්භ කරන ගැමියන්ට ප්‍රථමයෙන් මුණ ගැසෙන්නේ යාප්පුවෙන් හා කාරුණික ව සලකන යටත් විජිත පාලනයකි.

"දෙතුන් දවසකට පසු මුලර් පාටියෙ කුට්ටම් බත් උයන්ට යන  ගැහැණු අත්වල වළලු පුරවා ගෙන ආවෝය. ගෝනලාවේ අනික් ගැහැනුන්ට පෙනෙන්නට උන් ඔන්ගුවට අත් උඩ දැමුවෝය. වළලු සිලිං, බිලං හඬ නගමින් හෙල්ලුනේ ය." (හපුගොඩආරච්චි, 2018, 46).

ආරම්භයේ දී මල නොතලා රොන් ගන්නා බඹරෙකු සේ යටත් විජිත පාලකයන් ගෝනලාවේ වැසියන්ට තුටු පඩුරු ලබා දෙමින් යාප්පුවෙන් දුම්රිය මාර්ගයේ ඉදි කිරීම් කටයුතු සඳහා උපායශීලී ව ගෙන්වා ගන්නා ලදි. එම කර්තව්‍යයේ දී ශ්‍රම සූරාකෑම සඳහා මුදල් සේ ම විවිධ ද්‍රව්‍ය ද තෑගි ලෙස භාවිත කෙරෙයි. විශේෂයෙන් ගෝනලාවේ පුරුෂයන් දුම්රිය රථ මාර්ගය තැනීම සඳහා ගෙන්වා ගැනීමට තනතුරු හා මද්‍යසාර ලබා දීම වැනි කූට උපක්‍රම බ්‍රිතාන්‍යයෝ භාවිත කළහ. එහෙත් නැවත රැකියාවට නොයන්නට තීරණය කරන්නට නොහැකි බන්ධනයක් කරා තමන් ක්‍රමානුකූල ඇද වැටී

ඇති බව ඔවුන් පසක් කරගනු ලබන්නේ රදලයන් ද නියෝජනය වන බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය දුම්රිය මාර්ගය ඉදි කිරීම අනිවාර්ය රාජකාරියක් බවට සලකන බැවිනි. ක්‍රමයෙන් දෛනික වැටුප මාසික වැටුප බවට පත් වේ. රාජකාරියට නොපැමිණියහොත් සිරගත කරන්නට පවා හැකි නීතියකින් දුම්රිය මාර්ග කම්කරුවන් බවට පත් ගැමියෝ බැඳී සිටිති.

ස්වකීය රදල බලය වන්නිය අරා සිටි පාලනය ප්‍රතික්ෂේප කරන ගෝනලාවේ ගැමියන්ගේ නිවාස ගිනි තබා ආරච්චිල තහවුරු කරන්නට උත්සාහ ගන්නේ තවමත් සිය බලය අනුල්ලංඝනීය බව ය. එහෙත් එමගින් සත්‍ය ලෙස ම සිදු වන්නේ පැරණි සමාජය නියෝජනය කරන ගෝනලාවේ නායකයා ගොරබා ද ඇතුළු ආසියාතික යටහත්භාවය ගිනි ලෑම බව රදල පැලැන්තිය වටහා නොගනී. එහි අහිතකර ප්‍රතිඵලය කුලහීනයන්ට පමණක් නොව ආරච්චිල වැනි රදල පන්තිය නියෝජනය කරන රදලයන්ගේ ද අවසානය බව කතුවරයා කතා විකාසනයේ දී සූක්ෂ්ම අයුරින් දක්වයි. තවදුරටත් ආරච්චිලාගේ නියෝග අදාළ කර නොගන්නටත් අලුත් ජීවිත පැවත්මක් ස්ථාපිත කරන්නටත් නව සමාජ සබඳතා සහිත දුම්රිය මාර්ගය ගෝනලාවේ කුලහීනයන් වෙත දෑත දිගු කර තිබේ. එම දුම්රිය මාර්ගය ඔස්සේ වන්නි සමාජය වෙත ප්‍රවේශ වන්නේ යටත් විජිත බලාධිකාරය යි. ඒ වනාහි දුම්රිය මාර්ගය තැනීම සමග ආසියාතික සමාජය පෙරළා දමා යටත් විජිතයට අවශ්‍ය ධනේශ්වර සබඳතා පිහිටුවාලීමේ අරමුණ සාක්ෂාත් කරලීම යි. ඒ මතු නොව රා ස්වල්පයකින් මුසපත් වන ග්‍රාමීය ජන සමාජයට අබිං වැනි මත්ද්‍රව්‍ය මුසු වූයේ ද යටත් විජිතකරණයේ ප්‍රතිඵලයක් වශයෙනි. මත්ද්‍රව්‍ය වෙළඳාමේ යෙදෙන සොයිසා පසු කාලයක අරක්කු රේන්දය ලබාගැනීමට හැකි මට්ටමේ ආදායමක් අත්පත් කර ගන්නේ දුම්රිය මාර්ගයේ ඩන්ස්ටන්ගේ සහායක රැකියාව නිසා නොවන වග නවකතාව විමසීමේ දී පාඨකයාට විශද වේ.

ආරච්චිල නියෝජනය කරන රදල පැලැන්තියේ බලයට යටපත් වන ගොරබා නියෝජනය කරන්නේ ආසියාතික නැතහොත් ලාංකේය පැරණි පීඩිත ජන සමාජය යි. පීඩකයා සමග යාප්පුවෙන් හා කැපවීමෙන් ජීවත් වනු මිස පීඩාවට එරෙහි ව අරගලයකට ඔවුන් සූදානම් ව නැත. නව සමාජයක් ඉල්ලා සිටින මොහොතේ පදක්කයා ඇතුළු ගෝනලාවේ තරුණ පරම්පරාව ආරච්චිලාගේ තර්ජන මෙන් ම ගොරබාගේ නියමයන් ද ඉවත දමා දුම්රිය වැඩ බිම කරා යති. එය නූතන සමාජය වැඩවසම් ක්‍රමයෙන් ක්‍රමික ව මිදීම නිරූපණය කරයි. ඩන්ස්ටන්ගේ භූමිකාව එක් අතකින් දුම්රිය මාර්ගය වැඩබිමේ මූලිකයා ලෙස යටත් විජිත පාලනයේ බලය භාවිතයකි. අනෙක් අතින් එය සංස්කෘතික නියෝජනයකි.

විවිධ මානව සබඳතා නිරූපණය ප්‍රස්තුත නවකතාවේ සුවිශේෂීතාවකි. බලය පදනම් කර ගත් සබඳතා මෙන් ම මානුෂීයත්වය පදනම් කරගත් සබඳතා ද කතුවරයා කතා පුවත විකාසනය කිරීමෙහි දී උචිත අයුරින් යොදා ගැනීමට ප්‍රෝත්සාහී වේ. එමගින් නවකතාවේ රසාලිප්ත හා ආකර්ෂණීයභාවය තවදුරටත් රඳවා තබා ගැනීමට අවකාශය උදා වී ඇත. රම්බා හා ඩන්ස්ටන් අතර සබඳතාව, රම්බා හා පදක්කයා අතර සබඳතාව, ගවරා හා ගුරුළුමාලිය අතර සබඳතාව, ගවරා හා රූත් අතර සම්බන්ධය මෙන් ම ඩන්ස්ටන් හා රූත් අතර සම්බන්ධය ජීවන ලාලසාවේ අනේකවිධ මානව සබඳතා නිරූපණය

9 772950 655005

කරයි. සියලු නිර්මාණකරුවන්ට සිය නිර්මාණය ඉදිරිපත් කිරීමෙහි ලා තමාට රුචි, අනුභූතියට උචිත ආඛ්‍යානවේදයක් භාවිත කළ හැකි ය. කතුවරයා මායා යථාර්ථවාදයේ සෙවණැලි එක් චරිතයක් මතට පතිත කළ ද නවකතාවේ සමස්තය යථාර්ථවාදී ආඛ්‍යානයක් ඔස්සේ ඉදිරියට ගලා යාමට සලස්වයි. ඩුරන්ටිගේ "යථාර්ථවාදී මැනිෆෙස්ටෝවේ" නිර්වචනයට අනුව යථාර්ථවාදය යනු රචකයෙකු තමා ජීවත්වන යුගය සමීප ව, සාවධාන ව, බුද්ධිමත් ව නිරීක්ෂණය කොට, මිනිසාගේ සමාජීය අංශය සහ ඔවුන්ගේ භාවමය අංශය පිළිබඳ සම්පූර්ණ සත්‍ය අඩංගු වන සේ සත්‍ය සහ සෞන්දර්ය කැටි කොට කරන ප්‍රතිනිර්මාණයකි. (අමරකීර්ති, 20015, පි. 57). මෙමගින් යටත් විජිත පාලනය ඇති කරන සමාජ පරිවර්තනය එක් පසෙකින් ද ආසියාතික සමාජයේ පැවති මිනිස් පැවැත්මේ පසුගාමීත්වය තවත් පසෙකින් ද සාකච්ඡා කරන අතර, ප්‍රේමය, ඊර්ෂ්‍යාව, වීරත්වය, දීනත්වය, කාරුණිකත්වය සහ කෲරත්වය වැනි මානව ලක්ෂණ ද සෞන්දර්යාත්මක අයුරින් විශද කරයි.

නවකතාවක චරිත නිරූපණයට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. නවකතාකරුවාට ස්වකීය ධාරණාව අනුව අදාළ චරිත සජීවී ලෙස හැසිරවීමට හැකි විය යුතු ය. කතුවර විමල් උදය හපුගොඩආරච්චි එකී කාර්යයෙහි ලා මනා විචක්ෂණශීලී ය. ඊ.එම්. පොස්ටර් නම් විද්වතාගේ අදහසට අනුව චරිත වර්ග දෙකකි. එනම් පැතලි චරිත (හොඳ හෝ නරක බව එක වචනයකින් පැවසිය හැකි චරිත) හා වටකුරු චරිත (හොඳ නරක මිශ්‍රණයකින් යුත් චරිත) වේ. මෙම වර්ගීකරණය ප්‍රමාණවත් නොවන හෙයින් පසුකාලීන විචාරකයන් චරිත වර්ග පහක් දක්වා ඇත. එනම් සරල චරිත, සංකීර්ණ චරිත, පරිපූර්ණ චරිත, පැතලි රූපකාර චරිත සහ පසුබිම් චරිත යනුවෙනි. **යකඩ සිල්පර** කෘතිය පුරා විසිරී ඇති චරිත බොහෝ ය. සුදු චරිත මෙන් ම විටෙක වටකුරු චරිත ද, සංකීර්ණ චරිත සහ පසුබිම් චරිත ද කතා විකාසනය උදෙසා කතුවරයා උපයෝගී කර ගනියි. ඇතැම් චරිත කතා තේමාව විකාසනය උදෙසා බෙහෙවින් දායක වී ඇති අතර ම රම්බෝ, ඩිංගිරි අප්පු, සිවනාදන්, බයි අම්මා, විමලාවතී, සිරිල් යනාදි චරිත හිස් තැන් පිරවීම සඳහා අපූරුවට උපයෝගී කරගෙන ඇත. පුද්ගල චරිත විවරණයේ දී කතුවරයා බොහෝ චරිතවල බාහිර අංග ලක්ෂණ විස්තර කරමින් කතාව ගලායාමට ඉඩ සලස්වයි. ඩන්ස්ටන් මූලර් සංකීර්ණ සුදු චරිතයක් ලෙස චිත්ත රූප නංවන අතර, කතා සැකිල්ලෙහි බර දරන එක් ප්‍රධාන චරිතයකි. වස්තු විෂයයෙහි කළු චරිතයක් ලෙස සොයිසාගේ චරිතය විවරණය කරයි. ලොකු නායක ආරච්චිල යනු නවකතාවේ රදල පැලැන්තිය නියෝජනය වන චරිතයකි. ඔහු කටුවන්නා කෝරළයේ ගල්ලෑව වසමේ ආරච්චිල විය. ඔහුගේ කෲරත්වය අමානුෂිකත්වය මෙන් ම බ්‍රිතාන්‍යයන් කෙරෙහි පවත්නා අප්‍රසන්නතාව පිළිබඳ කතුවරයා සියුම් ව ගෙනහැර පෑමට සමත් වෙයි. කුලහීනයන් ඉදිරියේ බැටළු සම පොරවාගත් සිංහයෙකු මෙන් ද යටත් විජිත පාලකයන් ඉදිරියේ බැටළු පැටවකු මෙන් ද වූ ආරච්චිලාගේ පෞරුෂය කතුවරයා විසින් මනා ව විවරණය කරනු ලබයි.

එසේ ම කතුවරයා ඩන්ස්ටන්ගේ හා රූත්ගේ චරිත විවරණයේ දී දින පොත හා ලිපි මාර්ගයෙන් චරිතවල අභ්‍යන්තර මනෝමය පසුබිම් විවරණය කිරීමට උත්සුක වේ. රූත් ඇලීසියාගේ චරිතය කතුවරයා නිරූපණය කරන්නේ විටෙක රම්බාගේ දෘෂ්ටිකෝණයෙනි. තව ද රූත් වනාහී අයෝමය ගැහැනියක් බව නවකතාකරු පුන පුනා දක්වයි.

"සර් හෙට අනිද්දා මැඩම් එයි. මැඩම් පිරිමිය වාගේ කිසිදේකට බය ඇති ගෑණියෙක් නෙවෙයිනෙ." (හපුගොඩආරච්චි, 2018, 9).

නවකතාවේ අන්තර්ගත ලාංකේය චරිත වන ගොරබා, පදක්කයා සහ වන්නියේ මිනිසුන් ක්‍රියා කරනුයේ ලාංකේය සංස්කෘතියේ විධානවලට අනුව ය. ගොරබා යනු ගෝනලාව ගම්මැද්දේ නායකයා ය. කතුවරයා ගොරබාගේ චරිතය කතාවෙහි සුදු චරිතයක් ලෙස විකාසනය වන්නට ඉඩහසර ලබා දෙයි. එසේ ම සිය වර්ගයාගේ පැවැත්ම උදෙසා ඇපකැප වූ සැබෑ නායකත්ව ගුණාංගයක් ඔහුගේ භූමිකාව මගින් නිරූපණය වේ. යථෝක්ත කතාවෙහි ගවරාගේ චරිත නිරූපණය පමණක් මායා යථාර්ථවාදී ස්වභාවයක් විශද කරවයි. මායා යථාර්ථවාදයේ අරමුණ භව්‍යත්වය හා අභව්‍යත්වය, විශ්වසනීයත්වය හා අවිශ්වාසනීයත්වය අතර නව සම්බන්ධයක් ඇති කරමින් යථාර්ථවාදයේ විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීම යි. (දිසානායක, 2010, පි. 104). කතුවරයා ගවරාගේ චරිතය තේජස් ඇති දේහධාරී, සානුකම්පිත මෙන් ම අද්භූත චරිතයක් ලෙස හසුරවයි. මහා වනයේ වෙසෙන සතුන් සමග සන්නිවේදනය කරනු ලබන ගවරා වරෙක ධූමරථ මාර්ගයේ වැඩ කටයුතුවලට සිය අසහාය ශක්තිය යොදා ගනිමින් බාධා කරයි. රිපීටරය මගින් ඔහුට වෙඩි තැබුව ද වෙඩි නොවදියි. එසේ ම ඩන්ස්ටන්ගේ බිරිඳ වූ රූත් ගවරා සමග ගෙවූ දින කිහිපය කතුවරයා පාඨකයා ව ආස්වාදජනක නවමු මනෝ ලෝකයකට රැගෙන යාමට සමත් වෙයි. තවත් වරෙක කතුවරයා විසින් සහෘද චිත්ත අභ්‍යන්තරයේ ගවරා පිළිබඳ සංවේදී චිත්ත රූපයක් නිර්මාණය කරනු ලබයි. කතුවරයා ගවරාගේ චරිතය ඔහුගේ පුතුට මුණගස්වන්නේ ද එකී මායාකාරී අද්දැකීම් සමුදායත් සමගිනි. එහෙත් කතුවර විමල් උදය හපුගොඩආරච්චිගේ **යකඩ සිල්පර** නවකතාව වනාහි හුදු මායා යථාර්ථවාදී රීතියට පමණක් ලඝු නොවූ පුළුල් ජීවන දෘෂ්ටියක් සහිත ප්‍රබන්ධයක් බව සඳහන් කළ යුතු ම වේ.

කතුවරයා සිය කාර්යය විෂයයෙහි භාෂාව බුහුටි ලෙස යොදා ගැනීමෙහි සමත් ලේඛකයකු බව ඔහුගේ රචනා ශෛලිය විමසීමේ දී අනාවරණය වේ. කතා ප්‍රස්තුතය වන්නේ කටුවන්නා කෝරළයේ ගල්ලෑව වසම යි. එහෙයින් එකී ප්‍රදේශයට අනන්‍ය වූ භාෂා ව්‍යවහාරය ද විශේෂ යෙදුම් ද කෘතියෙහි සාර්ථකත්වය උදෙසා ඉවහල් වී තිබේ. විශේෂයෙන් ගෝනලාව ගම් මැද්දේ සාම්ප්‍රදායික භාෂා ව්‍යවහාරය කතුවරයා විසින් ඉතා අපූරුවට ගෙනහැර දක්වන බැවින් එය සජීවී චරිත ප්‍රතිනිර්මාණයට ආලෝකයක් ව ඇත.

"අද දොහට හැත්තට බත් තම්බන්ට ට හාල් තියෙනවා ඒත් හෙට මොකෑ කරන්නේ" (හපුගොඩආරච්චි, 2018, පි. 57).

"අප්පුච්චි මට දෙගුණෙයැ කොරෙක් සහේට ගන්ට. මං කියැච්චෙ කොරට බාල එකී." (හපුගොඩආරච්චි, 2018, පි. 70).

"මොකෑ බොල මේ මද්දහන්කොරේ?" (හපුගොඩආරච්චි, 2018, පි. 72).

එලෙසින්ම සොයිසාගේ, ඩන්ස්ටන්ගේ, රූත්ගේ වදන් මගින් පුර වහර මතු වේ.

"මේක තමයි ඩන්ස්ටන් මහත්තයාගෙ බංගලාව." (හපුගොඩආරච්චි, 2018, පි. 99).

"මේ කබඩ් එක සර් මට දීල තියෙන්නෙ බඩු දාගන්න." (හපුගොඩආරච්චි, 2018, පි. 106).

9 772950 655005

නවකතාවක භාෂා භාවිතයෙහි උපමා රූපක යොදා ගැනීම කතුවරයාගේ ප්‍රතිභාපූර්ණ ලේඛන ශෛලිය විශද කරවන්නකි. එමෙන් ම පාඨක සුබාවබෝධය ආකර්ෂණය තීව්‍ර කරවන්නකි. කතුවර විමල් උදය හපුගොඩආරච්චි චිරන්තන සාහිත්‍යයෙන් ලද ආභාසය සහ සාම්ප්‍රදායික ජන ජීවිතයෙන් ලත් ආභාසය නවකතාවෙහි අන්තර්ගත උපමා උපමේය මගින් ප්‍රකට කරවයි.

"අඩසඳ හේන් වට්ටක්කා පළුවක් සේ පඬු පැහැ එළිය විහිදවමින් දිලිසෙයි." (හපුගොඩආරච්චි, 2018, පි. 7).

"උකුස්සා දඩයමට පෙර ගස් ගොම්මනේ අත්තක වසා නිසොල්මන් වන්නාක් මෙන්" (හපුගොඩආරච්චි, 2018, පි. 14).

"ගම්මැද්දට කලංචි පඩියෙන් මහා බෝලිත්තක් වැටුණා වගේ ය." (හපුගොඩආරච්චි, 2018, පි. 50).

"අබුද්දස්ස කාලේ ඉබ්බොත් ඉගිලෙනවා කීවලු" (හපුගොඩආරච්චි, 2018, පි. 111).

රචකයා දෛනික ජීවන අද්දැකීම් පදනම් ව නිර්මාණය කර ගත් උපමාවලින් සහෘද සිත්හි චමත්කාරය දනවන අයුරු ප්‍රශස්ත ය. "අඩසඳ හේන් වට්ටක්කා පළුවක් සේ" යනාදි යෙදුම් ගද්‍ය කාව්‍ය ප්‍රබන්ධකරණයෙහි ලා බෙහෙවින් නැවුම් ය. මෙවන් දේශීය යෙදුම් මීට පෙරාතුව අපට හමු වන්නේ සීගිරි පද්‍ය විචාරණ කල්හි ය. සීගිරි කවියා සීගිරි ස්ත්‍රී රුව, ගුණ, ලාලිත්‍ය වර්ණනයේ ඇතැම් අවස්ථාවක දී කාන්තාවගේ දත් පෙළ කොමඩු ගෙඩියේ ඇට හා සමාන බවත්, ඇගේ වචන එහි මදය මෙන් ඉතා මියුරු බවත්, ඇගේ දිගැස් කොමඩු ගෙඩියේ පිට පොත්ත හා සමාන වන බවත් චිත්තරූප නංවමින් සඳහන් කරයි. "කොමුල් අමඩ් ලෙඩ් ලින සී - එබොන්ද මියුර් යහ බැසී - එකපල්දල වන් දිගැසී" ඊට කදිම නිදසුනකි. (නන්දසේන මුදියන්සේ, 2004, පි. 04).

ඒ මතු නො ව ගැමි ජනතාවගේ ශබ්දෝච්චාරණය කෙරෙහි සැලකිලිමත් වූ කතුවරයා ඒ අනුව උකහා ගත් ප්‍රදේශීය බස් වහරින් නවකතාව පෝෂණය කිරීමෙහි ලා සමර්ථ ව ඇත. නිදසුන් ලෙස, "හැබෑද" - ඇත්තද (හපුගොඩආරච්චි, 2018, පි. 12), "අව්කාස්ටකේ" - හිරු මැදියම (හපුගොඩආරච්චි, 2018, පි. 12), "ඇන්න ගොහුං" - රැගෙන ගිහින් (හපුගොඩආරච්චි, 2018, පි. 13), "හාටාව" - පාලම (හපුගොඩආරච්චි, 2018, පි. 21), "වෛතාලෙන්" - උදෑසනින් (හපුගොඩආරච්චි, 2018, පි. 38), "කලංචි පඩිය" - කාලතුවක්කුව (හපුගොඩආරච්චි, 2018, පි. 50) යන පද පෙන්වා දිය හැකි ය.

නිරූපිත අවස්ථාව හා සම්බන්ධ භාව ඇති කරලීමෙහි සමත් වන අයුරින් භාෂාව හැසිරවීමට විමල් උදය හපුගොඩආරච්චි කතුවරයා සමත් වී ඇත. පාඨකයා කතා පුවත කෙරෙහි ආකර්ෂණය කර ගැනීම සඳහා වස්තු විෂයේ ප්‍රබලත්වය මෙන් ම ඔහුගේ රචනා ශෛලිය ද ප්‍රබල වූ බැව් විටෙක හැඟේ. නවකතාවක් විචාරය කිරීමේ දී එකී නවකතාවෙහි දෘෂ්ටිකෝණය කෙරෙහි විචාරාක්ෂිය යොමු කිරීම ඉතා ම වැදගත් ය. නවකතාවක් අනාවරණය කළ හැකි මූලික ක්‍රම හතරකි. ඒ වනාහි සර්වේක්ෂණ රචනා ක්‍රමය, නාට්‍යමය රචනා ක්‍රමය, ප්‍රථම පුරුෂ රචනා ක්‍රමය සහ උත්තම පුරුෂ රචනා ක්‍රමය යි. ප්‍රස්තුත නවකතාවේ දී කතුවරයා ප්‍රධාන වශයෙන් තුන්වැන්නෙකුගේ දෘෂ්ටිකෝණයකින් හෙවත් ප්‍රථම පුරුෂ රචනා ශෛලිය උපයෝගී කරගනී. වරින්වර එය ඩන්ස්ටන්ගේ දින පොතට ද රූත්ගේ දින සටහන්වලට ද මාරු වෙමින් ගලා යයි.

9 772950 655005

සර්ව සම්පූර්ණ සාර්ථක නිර්මාණ බිහි වන්නේ කණ කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නාක් මෙන් ඉතා ම විරල වශයෙනි. එහෙයින් ඕනෑ ම සාර්ථක නිර්මාණයක පවා සුළු අඩු ලුහුඬුකම් ඇතිවීමේ ප්‍රවණතාවක් පවතී. චරිත ගොඩ නැංවීමේ දී හඳුනා ගත හැකි දුබලතාවක් වන්නේ කතුවරයා විසින් එක් එක් චරිත ලක්ෂණ ගෙනහැර පෑම ය. එය නවකතාවක සාහිත්‍යමය අගය දුර්වල කරවන්නකි. එමෙන් ම නවකතාව විසුරුණු ස්වභාවයක් ගැනීම ද විශද වන දුබලතාවකි. ඒ වූ කලී එක ම නවකතාවේ කතා කිහිපයක් අන්තර්ගත වීම යි. ඩන්ස්ටන්ගේ කතාව, රූත්ගේ කතාව, පදක්කයාගේ කතාව යනාදි වශයෙන් කතා රාශියක් එකට ගොනු නොවීමෙන් නවකතාවේ විසිරුණු ස්වභාවයක් ඉස්මතු වේ. විටෙක එය පාඨක රස නිෂ්පත්තිය කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කළ හැකි ය.

එසේ වුව ද සමස්තයක් ලෙස ප්‍රස්තුත නවකතාව කෙරෙහි විචාරාක්ෂිය යොමු කිරීමේ දී ගතානුගතික ග්‍රාමීය සමාජය දෙදරවාගෙන කම්කරු පන්තිය ගොඩ නැගෙමින් තිබූ අයුරුත් එහි ඇති වන සංකීර්ණ මානුෂිකත්ව ද යටත්විජිතකරණයේ බලපරාක්‍රමය මතින් යටපත් ව යන ගැමි ජන ජීවිතය ද සෞන්දර්යාත්මක ව මෙන් ම සානුකම්පිත ව උක්ත ආඛ්‍යානය මගින් විශද කරවයි. ප්‍රබන්ධය යනු සත්‍යයත් කල්පිතයත් අතර යම් සංසිද්ධියකින් පාඨකයාට ජීවිතාවබෝධය ලබා දෙන්නකි. රොබර්ට් ෂෝල්ස් නම් විචාරකයාට අනුව “ප්‍රබන්ධ කතාව තුළ සත්‍ය, ඉතිහාසය, යථාර්ථවාදය, අද්භූතවාදය මෙන් ම මායාව ද අන්තර්ගත ය.” එහෙයින් ප්‍රබන්ධකතාකරණය යනු ඉතා පුළුල් වපසරියක පැතිරුණු නිර්මාණයකි. ඒ අනුව **යකඩ සිල්පර** නවකතාව ප්‍රබන්ධ කතා ගණයෙහි ලා උත්කෘෂ්ට නිර්මාණයක් බැව් ගම්‍යමාන වේ. එපමණකුදු නො ව කෘතියට බලහත්කාරී ලෙස දේශපාලන ස්වභාවයක් ගෙන ඒම වෙනුවට කතා පුවතෙන් මවන චරිත, සිදුවීම්වලින් සහෘදයා ඥානනය කිරීමේ භාවිතය ද ප්‍රශංසනීය වේ. නිර්මාණයක කාර්යය වන්නේ සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාව කරා සීරුමාරුවට රැගෙන යාම යි. උක්ත නවකතාව එකී කාර්යයෙහි විශිෂ්ට ලෙස සමත් වී ඇත. එහෙයින් කතුවර විමල් උදය හපුගොඩආරච්චිගේ **යකඩ සිල්පර** නවකතාව ප්‍රශස්ත ය, ප්‍රශංසනීය ය.

## ආශ්‍රිත මූලාශ්‍රය

අමරකීර්ති, ලියනගේ. (2015). **අමුතු කතාව පශ්චාත් - යථාර්ථවාදී ප්‍රබන්ධ කතාවක් වෙත ආඛ්‍යාන න්‍යායික රචනා.** නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ඒකනායක, ධර්මසිරි. (2012). **සාහිත්‍යය හා විචාර කලාව**. බොරලැස්ගමුව: සංස්කෘති ප්‍රකාශන.

දිසානායක, විමල්. (2010). **නව විචාර සංකල්ප**. නුගේගොඩ: විසිදුනු ප්‍රකාශකයෝ.

පල්ලියගුරු, චන්ද්‍රසිරි. (2005). **රූපනය, නිරූපනය සහ සිනමාව**. කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

හපුගොඩආරච්චි, විමල් උදය, (2018). **යකඩ සිල්පර**. කොළඹ: ෆාස්ට් පබ්ලිෂන් ප්‍රයිවට් ලිමිටඩ්.

සංස්කරණ/පරිවර්තන

**සීගිරි පදාවලිය,** (2004). නන්දසේන මුදියන්සේ (පරි.), කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

9 772950 655005

එස්.ඒ.ජී. කවින්ද්‍යා
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
නර්තන හා නාට්‍ය කලා පීඨය
සන්නිවේදන හා ජනශ්‍රැති අධ්‍යයන උපාධි පාඨමාලාව
kavi96tcc@gmail.com

9 772950 655005